විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 1979 වසරේ සිට**
**ක්‍රීඩා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාඨමාලා පවත්වනු ලබන ප්‍රමුඛ ආයතනය වේ.**

# ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2019

## පුහුණුකරු උසස් පාඨමාලාව - කබඩි

ක්‍රීඩා ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති කබඩි පුහුණුකරුවන් සඳහා නවීන තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වේ.

**පාඨමාලා කාලය** : මාස 06 (මාස 3ක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලා කාලයක් සහ මාස 3ක පර්යේෂණ කාලයක් අන්තර්ගත වන අතර සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු.30,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන ක්‍රීඩා ඩිප්ලෝමාව සමත් වීම සහ ජාතික පාසල්, පාසල් සංගම් මඟින් සංවිධානය කරනු ලබන කලාප තරඟවල ජයග්‍රාහී කණ්ඩායමක පුහුණුකරුවෙකු වීම.

හෝ

2. වසර 03ක (අධ්‍යාපන විද්‍යා පීඨ) ශාරීරික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම සහ ජාතික පාසල්, පාසල් සංගම් මඟින් සංවිධානය කරනු ලබන කලාප තරඟවල ජයග්‍රාහී කණ්ඩායමක පුහුණුකරුවෙකු වීම.

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 235**

## ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I

ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා නිවැරදි තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් **පිහිනුම්, කරාතේ, වුෂු** ක්‍රීඩාවන්ට අදාළව පාඨමාලා පැවැත්වීමට නියමිතය.

**පාඨමාලා කාලය** : පැය 60කි.(සතියට දින 02 බැගින් සිකුරාදා සහ සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 7,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. විවෘත මට්ටමේ නම්, දිස්ත්‍රික් ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම්, ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හෝ කණ්ඩායම් පුහුණු කර තිබීම,

හෝ

2. පාසල් මට්ටමේ නම්, කලාප ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම් ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හෝ කණ්ඩායම් පුහුණු කර තිබීම.

හෝ

3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 204, 0112674636**

## ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර II

ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා නිවැරදි තාක්ෂණික දැනුම වැඩිදුරටත් ලබාදීමේ ඉදිරි පියවරක් ලෙස **පිහිනුම්, දැල්පන්දු** යන ක්‍රීඩාවන්ට අදාළව පාඨමාලා පැවැත්වීමට නියමිතය.

**පාඨමාලා කාලය** : පැය 120 **(සතියට දින 03 බැගින් - බ්‍රහස්පතින්දා,** සිකුරාදා සහ සෙනසුරාදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 10,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I පාඨමාලා **(පිහිනුම්, දැල්පන්දු)** සමත්ව තිබීම,

හෝ

2. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

සහ

3. පසුගිය වසර 02 තුළ පුහුණුකරුවෙකු ලෙස ජයග්‍රහණ ලබා තිබීම.

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 204, 0112674636**

**වැදගත් :** මෙම පාඨමාලාවන් සඳහා බඳවා ගැනීමේදී ඉල්ලුම් කර ඇති සුදුසුකම්වලට අමතරව ඉදිරිපත් කරනු ලබන ඉහළ දක්ෂතා සහ ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සඳහා වැඩි ප්‍රමුඛතාවක් හිමිවේ.

## අයදුම්පත් එවිය යුතු ආකාරය

සියලුම පාඨමාලා සඳහා අයදුම්පත් www.niss.gov.lk වෙබ් අඩවියෙන් හෝ සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.4.00 දක්වා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වෙත පැමිණ ලබාගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019 මාර්තු මස 08 දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සැයු :** අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන පාඨමාලාව/ ක්‍රීඩාව සඳහන් කළ යුතුය.

## ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව

ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයේ රැකියා කරන, රැකියාවක් අපේක්ෂා කරන පුද්ගලයින් සඳහා විද්‍යාත්මක ක්‍රීඩා පුහුණුකරණය පිළිබඳ 1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනත මඟින් ස්ථාපිත කර ඇති එකම ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පාඨමාලාව හැදෑරීම තුළින් දේශීය හා විදේශීය වශයෙන් පිළිගත් NVQ 05 මට්ටමේ සහතිකයක් හිමිවේ.

**පාඨමාලා කාලය** : මාස 12 (පූර්ණ කාලීන පාඨමාලාවකි)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 60,000.00

**පාඨමාලාව සඳහා බඳවාගනු ලබන වයස් සීමාව :** අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45ට නොවැඩි විය යුතුය)

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ)පරීක්ෂණයේදී සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06කින් සම්මාන 03ක් සහිතව සමත් වීම.

සහ

2. පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසැලක යටත් පිරිසෙයින් මාස 06 පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

හෝ

3. ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක හෝ ශාරීරික පුහුණු උපදේශකවරයෙකු/විරයක වශයෙන් මාස 06කට නොඅඩු මූලික සහ උසස් පාඨමාලාවක් සාර්ථකව හදාරා සමත්ව තිබීම.

හෝ

4. පාසැල් ක්‍රීඩා ගුරුවරයකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම.

හෝ

5. කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරඟයකට සහභාගී වී තිබීම.

හෝ

6. ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී දිස්ත්‍රික්ක මට්ටමේ තරඟයකදී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම. එසේ නැතහොත් ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරඟයකදී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතුය.

**සැ.යු :** රජයේ,පළාත් සභා හා ආයතනයන්,සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මඟින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 232/233**

## පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව

ශ්‍රී ලංකාවේ පුහුණුකරුවන්ගේ ක්‍රීඩා දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලාව පවත්වනු ලබන අතර **පැසිපන්දු, වුෂු, පාපැදි ක්‍රීඩාව හා ටෙනිස්** යන ක්‍රීඩා සඳහා වන පාඨමාලාවන්ට අයදුම්පත් කැඳවනු ලැබේ.

පාඨමාලා කාලය :මාස 03 (සෙනසුරාදා/ඉරිදා දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා ගාස්තු** : රු. 8,000.00

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. පුහුණු කරනු ලබන ක්‍රීඩාවට අදාළව අදියර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.
2. පුහුණුකරුවෙක් ලෙස වසර 05ක පළපුරුද්ද.
3. ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ අත්කරගත් ක්‍රීඩකයින් පුහුණු කර තිබීම.

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 241**

## ක්‍රීඩා ආබාධ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ක්‍රීඩකයින් ක්‍රීඩා ආබාධවලින් වළක්වා ගැනීම සහ ක්‍රීඩා ආබාධ කළමනාකරණය පිළිබඳ මූලික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා පවත්වනු ලබයි.

**පාඨමාලා කාලය** : පැය 100(සතියේ දින දෙකකදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු** : රු. 15,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

ක්‍රීඩා පුහුණුකරුවෙක් හෝ ශාරීරික යෝග්‍යතා උපදේශකවරයෙක් ලෙස අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් තිබීම.

**වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 235**

**අධ්‍යක්ෂ,ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය,**
**100/7, නිදහස් මාවත, කොළඹ 07.**
**දුරකථන : 011 2684921 ෆැක්ස්: 011 2667709 වෙබ් අඩවිය :** www.niss.gov.lk